# අපේ මනස් කුඩාකිරීම

සංස්කෘතිය යන වචනය ද අපට ලැබුණේ ඉංගිරිසියෙන් නොවේදැයි කිසිවකුට ඇසිය හැකි ය. කල්චර (culture) යන ඉංගිරිසි වචනය සඳහා දැනට වසර පනහකට හැටකට පමණ ඉහත දී සංස්කෘතිය යන වචනය නිර්මාණය කරගනු ලැබ ඇත. මෙහි දී කල්චර යන්නෙන් අදහස් වන්නේ මිනිසුන් විසින් වගාකෙරී ඇති නැතහොත් වර්ධනය කෙරී ඇති යම් යම් සමාජයීය ලක්‍ෂණ ය. එහෙත් මෙයින් කියැවෙන්නේ එවැනි අදහසක් සිංහල සමාජයෙහි අතීතයෙහි නොතිබූ බව නො වේ. මිනිසුන් විසින් නිර්මාණය කෙරී ඇති සියල්ල සංස්කෘතියට අයත් වෙයි. සිංහල මිනිසුන් විසින් නිර්මාණය කෙරී ඇත්තේ සිංහල සංස්කෘතිය ය. ඉංගිරිසින් විසින් නිර්මාණය කෙරී ඇත්තේ ඉංගිරිසි සංස්කෘතිය ය.

නිර්මාණ යනුවෙන් අදහස් කෙරෙන්නේ භෞතික වස්තූන් පමණක් නො වේ. ආචාර ධර්ම, සිරිත් විරිත්, ආහාර ගැනීමේ ක්‍රම, නැටුම් ගැයුම් ආදී භෞතික නොවන දේ ද සංස්කෘතියට අයත් ය. දැනුම ද සංස්කෘතියෙහි කොටසකි. මේ සියල්ල එකට බැඳ තබනු ලබන්නේ චින්තනයෙනි. චින්තනය යනු හුදු සිතීම නො වේ. සංස්කෘතිය හා චින්තනය අතර ඇත්තේ ඉතා සියුම් සම්බන්ධයකි. චින්තනය යන්නට ඉංගිරිසි වචනයක් නැත. ඉංගිරිසියෙන් තෝට් යන්නෙන් කියැවෙන්නේ සිතීම මිස චින්තනය නො වේ.

අපට අපේම දේ නිර්මාණය කරගත හැකි ය. අප එසේ නිර්මාණය කරන්නේ චින්තනය මත පදනම් වී ය. එසේත් නැතහොත් අපට වෙනත් සංස්කෘතියක ඇති දෙයක් , එනම් වෙනත් අය විසින් නිර්මාණය කෙරී ඇති සමාජයීය ලක්‍ෂණයක් අපට අපේ සංස්කෘතියට අවශෝෂණය කර ගත හැකි ය. අපි දඹදිව නිර්මාණය වූ බෞද්ධ සංස්කෘතිය අපට අවශ්‍ය ආකාරයට අවශෝෂණය කර ගත්තෙමු. ඇතැම් විට අපි අනෙක් සංස්කෘතීන්හි ලක්‍ෂණ අනුකරණය කරමු. අද අපි බොහෝ විට බටහිර සංස්කෘතිය අනුකරණය කරමු. එයට ප්‍රධාන හේතුවක් වී ඇත්තේ සංස්කෘතික යටත්විජිතවාදය ය. එසේත් නොමැති නම් බටහිර ක්‍රිස්තියානි යටත්විජිතවාදයෙහි සංස්කෘතික සංරචකය ය.

සංස්කෘතික යටත්විජිතවාදය බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ම ලක්‍ෂණයකි. සංස්කෘතික යටත්විජිතවාදයෙහි දී එක් රනවර්ගයක සංස්කෘතියක් අනෙක් ජනවර්ගයක් මත බලයෙන් උපක්‍රමයෙන් හෝ වෙනත් අයුරකින් හෝ පැටවෙයි. එසේ පැටවෙන සංස්කෘතිය පැතිරවීම ද කෙරෙයි. එය එක් සංස්කෘතියක් වෙනත් සංස්කෘතියක ලක්‍ෂණයක් ස්වේච්ඡාවෙන් අවශෝෂණය කිරීමට වඩා වෙනස් ය. බටහිරයන් යටත්විජිත සොයමින් ලෝ පුරා ගියේ ඔවුන්ගේ සංස්කෘතිය පැතිරවීමේ ද අභිලාෂයෙනි. එය යුදෙව් සංස්කෘතියෙන් බටහිරයන් ලබාගත්තකි. යුදෙව් චින්තනය බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය නිර්මාණයෙහිලා දැඩි බලපෑමක් කෙළේ ය. බටහිර සංස්කෘතික යටත්විජිතවාදය බටහිර රටවල ද ක්‍රියාත්මක විය. සංස්කෘතික යටත්විජිතවාදය ඇතිවන්නේ වෙනත් මහාද්වීපයක සංස්කෘතියක් බලයෙන් පැටවීමේ දී පමණක් නො වේ. එකම මහාද්වීපයේ රටවල්වලට ද සංස්කෘතික යටත්විජිතවාදයේ බලපෑම වෙයි.

එයට හොඳම උදාහරණය එංගලන්තයේ යටත්විජිතවාදයට හසු වූ අයර්ලන්තය හා ස්කොට්ලන්තය යන රටවල් ය. අයර්ලන්තය හා ස්කොට්ලන්තය කතෝලික සංස්කෘතියට අයත් කතෝලික රටවල් විය. එහෙත් ඒ රටවල් බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියේ රටවල් බවට පත්විය. දකුණු අයර්ලන්තයේ ආගම තවමත් කතෝලික වෙයි. එහෙත් සංස්කෘතියෙන් එරට වැසියෝ ද උතුරු අයර්ලන්තයේ වැසියන්ගෙන් බහුතරයක් මෙන් ම යුදෙව් ක්‍රිස්තියානි වෙති. ප්‍රංශය, ජර්මනිය යන රටවල ද තත්වය එසේ ම ය.

එහෙත් එයට පෙර තිබූ බොහෝ යටත්විජිතවාදවල ඒ ලක්‍ෂණය දක්නට නො වී ය. උදාහරණයක් ලෙස චෝල අධිරාජ්‍යයට අනුරාධපුරය ටික කලකට යටත් වූ නමුත් හින්දු සංස්කෘතික යටත්විජිතවාදයක් මෙරට ක්‍රියාත්මක නො විය. එකල යටත්විජිතවාදවල තිබුණේ බොහෝවිට දේශපාලන සංරචකය පමණකි. මෙරට සංස්කෘතිය චෝළ හින්දු සංස්කෘතියෙන් වෙනස් විය. එහෙත් හින්දු සංස්කෘතිය මෙරට ප්‍රචලිත නො කෙරිණි. සිංහල බෞද්ධයන් හින්දු සංස්කෘතියෙහි ඇතැම් දෑ අවශෝෂණය කරන්නට ඇත. එහෙත් එය සංස්කෘතික යටත්විජිතවාදයක ප්‍රතිඵලයක් නොව ස්වේච්ඡාවෙන් කෙරුණක් විය.

© Prof. Nalin De Silva

සංස්කෘතික යටත්විජිතවාදයක් ඇතිවන්නේ අදාළ යටත්විජිතවාදයෙහි සංස්කෘතික සංරචකයක් ඇත්නම් මිස යටත්විජිතවාදී සංස්කෘතිය එකම මහාද්වීපය ද, සමීප සංස්කෘතියක ද නැත් ද ආදී කරුණු මත පදනම් වී නො වේ. බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි යුදෙව් සංස්කෘතියෙන් ලබාගත් සංස්කෘතික සංරචකයක් වෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි යටත්විජිතවාදය සංස්කෘතික යටත්විජිතවාදයක් ද වන්නේ එබැවිනි.

යම් අයුරකින් චෝළ යටත්විජිතවාදයෙහි දේශපාලන සංරචකයට අමතරව සංස්කෘතික සංරචකයක් ද වී නම් විජයබා රජුට චෝළ සංස්කෘතික යටත්විජිතවාදයට ද එරෙහිව සටන්කිරීමට සිදුවීමට තිබුණි. ලෝකයේ සංස්කෘතික, ආර්ථික හා දේශපාලනික සංරචක තිබි එකම යටත්විජිතවාදය බටහිර ක්‍රිස්තියානි නූතනත්ව යටත්විජිතවාදය විය යුතු ය. අද මුළු ලෝකයම ආර්ථික හා වෙනත් ප්‍රශ්නවලට මැදි වී තිබීමට ප්‍රධාන හේතුව මේ යුදෙව් ක්‍රිස්තියානි යටත්විජිතවාදය ය.

සංස්කෘතික යටත්විජිතවාදය විසින් ඉතා සියුම්ව ද ඇතැම්විට ආක්‍රමණශීලීව ද අප සංස්කෘතිය වෙනස් කෙරෙයි. ආක්‍රමණශීලීව කෙරුණු වෙනස්කම් පිළිබඳ අපට යම් අවබෝධයක් වෙයි. එහෙත් එහි පවා ඉතිහාසයෙන් මැකී ගොස් ඇති දෑ අපට දැන් අමතක ය. ලන්දේසීන් මෙරටට එන විට මෙහි සිංහල වෙදකමක් තිබී ඇත. බුද්ධදාස රජතුමා සිංහල වෙදකමෙහි නියැළුණු අයකු මිස ආයුර්වේද වෛද්‍යවරයෙක් නො වී ය. නිල වෙදකම සිංහල වෙදකමෙහි එක් අංගයක් පමණකි. ලන්දේසින් මෙරට තිබු පැළ වර්ගීකරණය එරටට ගෙන ගොස් ඒ ඔවුන්ගෙ සංස්කෘතියට අවශෝෂණය කරගත්හ. ලීනියාස්ගේ වර්ගීකරණය නමින් අද හැඳින්වෙන්නේ එලෙස ලන්දේසීන් විසින් අවශෝෂණය කෙරී සකස්කර ගන්නා ලද වර්ගීකරණය ය.

ලන්දේසීන් මේ දැනුම අපෙන් ලබාගත්තා පමණක් නො වේ. ඔවුහු මෙරට තිබූ වෙදකම පිළිබඳ පොත් ද විනාශ කළහ. අද සිංහල වෙදකම නමින් ඉතිරි වී ඇත්තේ පැරණි වෙදකමෙන් පාරම්පරිකව රැකගත් අංග කිහිපයක් පමණකි. ඇතැම් විට මෙරට තිබූ සංගීතය ද ඒ ආකාරයෙන් ම විනාශ කර දමන්නට ඇත. ගුත්තිලය ලියැවුණු කාලයෙහි ද ගායනය, වාදනය හා නෘත්‍යය රැගත් සංගීතයක් තිබූ බව එහි ඇති ඇතැම් කවිවලින් පෙනී යයි. ඉතා ඈත අතීතයෙහි ද මෙරට සංගීත ශිල්පීන් සිටි බව ඉසුරුමුණියේ ඇති චිත්‍රවලින් හා කැටයම්වලින් පෙනී යයි.

අද ඇතැම් පඬියන් අපට සංගීතයක් තිබී නැත ආදී වශයෙන් කියන කතාවල සත්‍යතාවක් නැත්තේ ඉහත කී අයුරින් සංගීතය ගැන පොත්වලින් මෙන් ම ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාක්ෂිවලින් ද හෙළිවන බැවිනි. ඇතැම් විට සංගිතය නැතිකිරීම ද ලන්දේසීන් අතින් ම සිදුවන්නට ඇත. ඒ කුමක් වුවත් මෙරට සංස්කෘතිය වෙනස්කිරීමට පෘතුගීසීහු හා ලන්දේසීහු ක්‍රියා කළහ. ඉංගිරිසින් අපේ සංස්කෘතිය දැනුවත් ව වෙනස්කර ඇති ආකාරය පැහැදිලි ය.

බටහිර සංස්කෘතික යටත්විජිතවාදය, එනම් බටහිර සංස්කෘතිය මෙරට ප්‍රචලිත කිරීම ලන්දේසීන් හා ඉංගිරිසින් විසින් ගොරහැඩිව ද සියුම්ව ද ක්‍රියාත්මක කරන ලදී. අප කුඩා රටක් බවත් අපට වෙදකම, සංගීතය, විද්‍යාව, ගණිතය ආදිය නොමැති බවත් පුන පුනා කියන ලදී. ඒ ඒ කාර්යයන්හි සුළු කොටස් පාරම්පරිකව රැකගෙන ආ පිරිස සමාජයෙන් කොන්කරන ලදී. ඔවුන් කුල වශයෙන් ගත්කල පහත්කරන ලද්දේ ඉංගිරිසින් විසිනි. සමාජයෙහි වැදගත් තැනක් ලැබුණේ බටහිර වෘත්තීන්හි පුහුණුවක් ලැබුවනට හා බටහිර සිරිත් විරිත් කරපින්නා ගත්තවුනට ය. අපට හීනමානයක් ඇතිකරන ලදී. අප කුඩා රටක් යැයි කියමින් සංස්කෘතිකව යමක් නිර්මාණය කරගැනීමට නොහැකි බව ද අපට එත්තුගන්වන ලදී.

සිංහල උගතාට වඩා ඉංගිරිසි උගතාට රටේ වැදගත්කමක් හිමිකරනු ලැබිණි. භික්ෂූන් වහන්සේ සමාජයෙන් කොන්කර ආගමික වතාවත්වලට පමණක් සීමාකරන ලදී. ගොවිකම ඕනෑම අයකුට කළහැකි දෙයක් ය යන අදහස රටේ පැතිරවිණි. වෙළෙඳාම ඉගෙනීමක් ඇතිව අවබෝධයක් ඇතිව කළයුත්තක් බවට සමාජයේ මතයක් ඇතිකෙරුණේ බටහිර සංස්කෘතියෙහි වෙළෙඳාමට තිබූ තැන සිහිගන්වමිනි. දැන වෙළෙඳම් නොදැන ගොවිකම් වැනි පිරුළු සකස් කෙරුණේ අපේ ආකල්ප වෙනස්කිරීමට ය.

© Prof. Nalin De Silva

අපේ සංස්කෘතිය එලෙස බාල්දු කරද්දී අපට සිදුවූයේ අපට පෙනෙන්නට ඉතිරිව තිබූ වැව හා දාගැබ ඔසවා තැබීමට ය. වෙදකමක්, ගොවිකමක්, ආර්ථිකයක්, සංගීතයක් නැති කළවිට ජනතාවක් වැව හා දාගැබ තම වැදගත් කමේ සංකේත ලෙස භාවිතා කෙළේ නම් එහි පුදුම වන්නට දෙයක් නැත. එහෙත් අපි එපමණින් නැවතී අපට වෙනත් කිසිවක් නැත යන මතයට හිස නැමුවෙමු. වැව් දාගැබ් තැනූ ජනතාවක් කළාත්මක පිළිම වහන්සේ නෙළූ ජනතාවක් සංගීතයක් නිර්මාණය නොකර සිටී ද වෙදකමක් නිර්මාණය නොකර සිටී ද ආදී ප්‍රශ්න නොඇසීමට අපේ උගතුන්ගේ මනස් සකස් කෙරී තිබුණි. ඕල්කට්තුමා උගතුන්ට හා අනෙක් අයට සිංහල බෞද්ධ මනසක් වෙනුවට ජාත්‍යන්තර බෞද්ධ මනසක් ද ලබාදීමට දහනවවැනි සියවස අගභාගයේ දී කටයුතු කෙළේ ය.

මේ සියල්ලෙහි ප්‍රතිඵලය වූයේ අප වැරදි මාවතක ගමනක් ඇරඹීම ය. විසිවැනි සියවසේ අපට නැවතත් නිදහස අවශ්‍ය වී තිබුණි. එහෙත් ඒ දිනාගැනීම සඳහා අපට නායකයෝ නො සිටියහ. එක් පැත්තකින් අපට ඉංගිරිසීන් විසින් ලබාදෙන ලද නායකයෝ වූහ. ඔවුහු ඉංගිරිසින් අනුකරණය කරමින් ඉන්දියාවට පිටින් යමින් සීමිත නිදහසක් වෙනුවෙන් පෙනී සිටියහ. සටන් මගින් නොව පෙත්සම් මගින් ඉංගිරිසින්ගෙන් යම් දේශපාලන නිදහසක් (සංස්කෘතික හා ආර්ථික නිදහසක් නැතිව) දිනාගැනීම ඔවුන්ගේ සීමිත අරමුණ විය.

අනෙක් පැත්තෙන් සිංහලයට ලැදි උගතුන් පිරිසක් ද මෙරට බිහිවූහ. අවාසනාවකට සෘජුව දේශපාලන නිදහස දිනාගැනීම ඔවුන්ගේ අභිලාෂය නො වීය. ඔවුහු සංස්කෘතික යටත්විජිතවාදයට එරෙහිව ක්‍රියාකළහ. (එය වක්‍රව දේශපාලන යටත්විජිතවාදයට ද එරෙහිව කරන ලද සටනක් බව පිළිගත යුතු ය.) එහෙත් ඔවුන්ගේ මනස් ද මේ වන විට කුඩාකර තිබුණි. අපේ සංස්කෘතියක් වර්ධනයකිරීම යන්න ඔවුන් දුටුවේ ඉන්දියාවේ ආධාරයෙන් කළයුතු එකක් ලෙස ය. ඔවුන් ද දැක්කේ වැව හා දාගැබ පමණකි. මෙරට වෙදකමක් සංගීතයක් ඇතැයි යන්න උපකල්පනය කිරීමටවත් ඔවුහු මැළිවූහ. ඔවුන් අපේ සංස්කෘතිය දුටුවේ ඉන්දියාවෙහි ය. දේශීය සංස්කෘතිය දියුණුකිරීමට නම් පළමුව ඉන්දියාවට ගොස් ඒ ඒ ක්ෂේත්‍ර හැදෑරිය යුතු යැයි ඔවුහු කල්පනා කළහ. සංගීතය හා වෙදකම හැදෑරීමට දක්ෂ තරුණයෝ ඉන්දියාවට පිටත්කරනු ලැබූහ. ඒ තරුණයෝ ඉන්දියාවෙහි දී උත්තර භාරතීය සංගීතය හා ආයුර්වේදය හැදෑරූහ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva